*සැ. යු.* - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI වන කොටසේ 2024 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,399 - 2024 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2024.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 318 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 319 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 සැප්තැම්බර් මස 13 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අගෝස්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


317 - B 082600 - 353 (2024/08)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) දිසානායක මුදියන්සේලාගේ අනුර කුමාර දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.02.23 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 07808 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වැවගම, ඉදිපිටියවත්ත පදිංචි කරුණාපේඩි දූරයලාගේ ගරු වෙත ප්‍රදානය කොට කුලියාපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කුලි/කේ 08/161 යටතේ 1990 මාර්තු 16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍ර උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.04** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුයි.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මයුරාවතී කෝරළේ 1096 වැවගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දියාවල නමැති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේයර් ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 6 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 959 දරන පිඹුරෙහි අංක 149 බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.079 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද ඉදිපිටියවත්ත නමැති රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : මාර්ග රක්ෂිතය |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 959 කැබලි අංක 150, |
| *දකුණට* | : ප්‍රවේශ මාර්ගය, |
| *බස්නාහිරට* | : අ. ග. පි. 959 කැබලි අංක 148 |

ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුලියාපිටිය (බටහිර)

2023 අගෝස්තු මස 23 වැනි දින.

08-181/1

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් පී. එම්. එස්. ප්‍රියංගනී පතිරාජ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.03.21 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 03929 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පාදෙණිය, වේපත්අංග පදිංචි විජේකෝන් මුදියන්සේලාගේ අප්පුහාමි වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක D37/2179/86 යටතේ 1986.06.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.04** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොළ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, දේවමැදි හත්පත්තුවේ, මැදග න්දහය කෝරළේ 1271 - නරමාන (පැරණි 329 මගුලාගම) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වේපත්අංග නමැති ගමේ පිහිටා ඇති, සර්වේයර් ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 2724 දරන පිඹුරෙහි අංක 360 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 01, පර්චස් 14 ක් ඇතැයි ගණන් බලා තිබෙන මීගහමුල හේන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ ද රජයේ ඉඩම් කට්ටිය :-

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 361 පාර, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 362, |
| *දකුණට* | : කැබලි අංක 365 සහ 366, |
| *බස්නාහිරට* | : කැබලි අංක 359. |

පී. එම්. එස්. ප්‍රියංගනී පතිරාජ,
ප්‍රාදේශීය ලේකම්,
වාරියපොල.

2023 නොවැම්බර් මස 15 වැනි දින.

08-181/2

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/70512.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : UPLC/L/26/KG/L/214

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 146 ඩී කරවිලේ ග්‍රාම නිලධාරී වසමේ, මයිලගම ගමෙහි පිහිටි ජනපද නිලධාරී මහතා විසින් අඳින ලද අංක UVA/MO/KTG146D/LTL/AGRI/213 හා 2016.12.04 දිනැති දළ අනුරේඛනයේ අංක A ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 01 පර්චස් 33.01 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුත්තක් සඳහා දසරත් හෙට්ටිආරච්චි විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | පරණ කරවිලේ පාර, |
| *නැගෙනහිරට* | : | ජී. බී. සනත්ගේ ඉඩම, |
| *දකුණට* | : | ආර සහ රක්ෂිතය, |
| *බටහිරට* | : | එච්. ආර්. කේ. මාලනීගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) යි (2023.04.20- 2053.04.19) දක්වා

*වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල :- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති/සාදනා ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.04.20 දින සිට වසර 5ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 ජූලි මස 29 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-146

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/74838.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NCP/PLC/L07/10/04/02

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 276, කීරික්කුලම ග්‍රාම නිලධාරි වසමේ කීරික්කුලම ගමේ කැ. සි. අංක 110191 හි කැබලි අංක 70 න් කොටසක් දැක්වීම සඳහා අඳින ලද 0021 අනුරේඛනයේ කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 1.1462 ක් පමණ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා හෙට්ටිආරච්චිගේ දොන් අජන්ත පුෂ්ප කුමාර මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | කසි 110191 කලාපය 07 කැබලි අංක 70 හි ඉතිරි කොටස සහ මාර්ගය (ප්‍රාස), |
| *නැගෙනහිරට* | : | මාර්ගය (ප්‍රාස) සහ කසි 110191 කලාපය 8, |
| *දකුණට* | : | කසි 110191 කලාපය 07 කැබලි අංක 70 හි ඉතිරි කොටස, කසි 110191 කලාපය 8 සහ කසි 110191 කලාපය 07 කැබලි අංක 69, |
| *බටහිරට* | : | 10191 කලාපය 07 කැබලි අංක 69 සහ කසි 110191 කලාපය 07 කැබලි අංක 70 හි ඉතිරි කොටස |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහ (30) යි (2024.04.10 දින සිට වසර තිහක් ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* .- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ මිලියන පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2024.04.10 දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු හෝ පැවරීම සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 අගෝස්තු මස 05 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-147

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/75279.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : SPLC/MAT/3/33/3/162

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ , පැළෑන දකුණ ග්‍රාම නිලධාරි වසමේ, පැළෑන ගමේ පිහිටි මු. පි. මාර. 879 හි කැබලි අංක 32 න් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 15.6 ක් වූ රජයේ ඉඩම් කැබැල්ලක් තීම් රිසෝර්ට්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වාණිජ කටයුතු සඳහා බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 31, 26, 25, 16, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 25 සහ 16, |
| *දකුණට* | : | කැබලි අංක 16 සහ 41, |
| *බටහිරට* | : | කැබලි අංක 31 සහ 26. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ;

(*අ*) *බදු කාලය* .- අවුරුදු තිහ යි (30) (2024.05.06 දින සිට 2054.05.05 දක්වා),

(*ආ*) *වාර්ෂික බදු මුදල*.- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2024 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ,

(*ඇ*) මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය,

(*ඈ*) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය,

(*ඉ*) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය,

(*ඊ*) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය,

(*උ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

(*ඌ*) බද්ද ක්‍රියාත්මක වන 2024.05.06 දින සිට වසර 05 ක අවම කාලයක් ඉක්මවීමට පෙර අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ,

(*එ*) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලිඛිතව මා වෙත ඉදිරිපත් නොකළහොත් උක්ත ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 අගෝස්තු මස 07 වැනි දින,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-148

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/76235.
*මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* :
සීපීසී/එල්සී/එල්ඩී/4/1/27/332

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිගම්පතහ E 453 A ග්‍රාම නිලධාරි වසමේ, දිගම්පතහ ගමේ කැඩැස්තර සිතියම් අංක 310019 කලාප අංක 02 කැබලි අංක 111 කොටසක් දැක්වීමට බලයලත් මිනින්දෝරු රන්ජන් ඒ. දිසානායක විසින් අඳින ලද 1382 දරන අනුරේඛනයේ කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් පර්චස් 18ක් වූ රජයේ ඉඩම් කොටස ලියනගේ ටෙරන්ස් ඔගස්ටස් පෙරේරා මයා වෙත වාණිජ කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැ. සි. අංක 310019 හි කලාප 02 හි කැ.අ. 554 සහ 100, |
| *නැගෙනහිරට* | : | කැ. සි. අංක 310019 හි කලාප 02 හි කැ. අ. 100 සහ 82, |
| *දකුණට* | : | කැ. සි. අංක 310019 හි කලාප 02 හි කැ. අ. 82 සහ 111 (මෙම ඉඩමේ ඉතිරි බිම) |
| *බටහිරට* | : | කැ. සි. අංක 310019 හි කලාප 02 හි කැ. අ. 111 (මෙම ඉඩමේ ඉතිරි බිම) කැ. අ. 556 සහ කැ. අ. 554 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

(අ) *බදු කාලය* .- අවුරුදු තිහ යි (30) (2024.05.28 දින සිට වසර 30ක් ඉදිරියට)

*(ආ) වාර්ෂික බදු මුදල*.- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ මිලියන පහට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ,

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය,

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය,

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය,

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය,

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(ඌ)* 2024.05.28 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ,

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත,

*(ඒ)* ප්‍රාදේශීය සභාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය විසින් පනවන කොන්දේසිවලට යටත් විය යුතුය.

මෙහි පහත සඳහන් දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. ජී. පී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 ජූලි මස 26 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැඳුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-176

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/74260.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය එන්සීපී/පීඑල්සී* එල්03/කැකි/4 (III).

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 632, ඇඹුල්ගස්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇඹුල්ගස්වැව ගමේ රජයේ මිනින්දෝරු විසින් සකස් කරන ලද 2018/කැකි/36 දළ අනුරේඛනයේ කැබලි අංක 01 සහ 02 න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 03 රූඩ් 03 පර්චස් 28.96 ක් පමණ වූ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ලියන මුදියන්සේලාගේ පුංචි බංඩාර ප්‍රේමතිලක මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැකිරාව ගනේවල්පොල ප්‍රධාන මාර්ගය සහ රජයේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | රජයේ ඉඩම, |
| *දකුණට* | : | රජයේ ඉඩම සහ ප්‍රධාන මාර්ගය, |
| *බටහිරට* | : | රජයේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස කොට තිබේ:

(අ) *බදු කාලය* .- අවුරුදු තිහ යි (30) (2024.06.07 දින සිට ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට හෝ (රු. 5,000,000) ට කට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2024 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ,

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය,

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය,

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය,

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(උ)* 2024.06.07 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ,

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 අගෝස්තු මස 06 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-177

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/67954.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NCP/PLC/L07/10/04/02

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 241, තම්මැන්නාපුර ග්‍රාම නිලධාරි වසමේ, ඥානික්කුලම ගමේ අ. ග. පි. 262 හි කැබලි අංක 386 න් කොටසක් පෙන්වීමට ඉඩම් නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 2.5628 ක් පමණ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා එදිරිසිංහ ආරච්චිලාගේ ලක්ෂ්මි මංගලිකා අයිරාංගනී මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | 17/2019 අනුරේඛනයේ අතුරු මාර්ගය, |
| *නැගෙනහිරට* | : | 17/2019 අනුරේඛනයේ සමරපුර රජයේ නිවාස ව්‍යාපෘතිය, |
| *දකුණට* | : | 17/2019 අනුරේඛනයේ වැව් රක්ෂිතය හා ඒ. ආර්. වික්‍රමසිංහගේ පුද්ගලික ඉඩම, |
| *බටහිරට* | : | 17/2019 අනුරේඛනයේ 1/262 ඉ.සං.ආ. බලපත්‍ර ඉඩම හා ඒ. ආර්. වික්‍රමසිංහගේ පුද්ගලික ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස කොට තිබේ:

(අ) *බදු කාලය* .- අවුරුදු තිහ යි (30) (2024.04.10 දින සිට වසර තිහක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල* .- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) හෝ මිලියන පහකට වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ,

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය,

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය,

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

(උ) 2024.04.10 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නො ලැබේ,

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 අගෝස්තු මස 07 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-178

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/73154.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : එන්සීපී/පී එල්සී/එල්02/මනුප/04(01) - 2023

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 282, පහලගම ග්‍රාම නිලධාරී වසමේ ඉඩම් නිලධාරී විසින් අඳින ලද දළ අනුරේඛනයෙහි කැබලි අංක 01න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 06ක් පමණ වන රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා රතුවඩුගේ ලක්මාල් ලාල් විජේරත්න මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඩබ්. ජී. ජයන්තගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | මාර්ග රක්ෂිතය හා අධි බලැති විදුලි රැහැන් රක්ෂිතය, |
| *දකුණට* | : | එම්. ඉන්ද්‍රාණිගේ ඉඩම, |
| *බටහිරට* | : | රජයේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

(අ) *බදු කාලය* .- අවුරුදු තිහ (30) යි (2024.04.10 - 2054.04.09)

(ආ) *වාර්ෂික බදු මුදල* .- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2024 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ (රු. 5,000,000) ට වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) 2024.04.10 දින සිට වසර 05 ක් ගත වන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(එ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 අගෝස්තු මස 08 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-179

---

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/72953.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NCP/PLC/L02/ මනුප/04/01.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 286, ඇලයාපත්තුව ග්‍රාම නිලධාරි වසමේ ඇලයාපත්තුව ගමේ අ. ග. සි. අංක 704 හි කැබලි අංක 03 න් කොටසක් පෙන්වීමට ඉඩම් නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයෙහි කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 02 ක් පමණ වන රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා රාජපක්ෂ පතිරණලාගේ මනෝජ් ප්‍රසන්න රාජපක්ෂ මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඊ. එම්. ජයසිංහගේ ඉඩම හා එන්. ඒ. සම්පත් කුමාරගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | එන්. ඒ. සම්පත් කුමාරගේ ඉඩම හා මාර්ග රක්ෂිතය, |
| *දකුණට* | : | මාර්ග රක්ෂිතය, |
| *බටහිරට* | : | ඊ. එම්. ජයසිංහගේ ඉඩම හා මාර්ග රක්ෂිතය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහ (30) යි (2023.04.27 සිට වසර 30 ක් ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහට හෝ (රු. 5,000,000) ට වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2023.04.27 දින සිට වසර 05 ක් ගත වන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 අගෝස්තු මස 08 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැඳුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-180

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/76190.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NWP/PLC/L9/WP/LTL/24.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1283, කැළේගම ග්‍රාම නිලධාරි වසමේ, එගොඩපලයාගම ගමේ අ. ග. පි. 2829 හි කැබලි අංක 245 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0934 ක් සහ කැබලි අංක 246 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6189 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා අත්තනායක මුදියන්සේලාගේ හැරී අත්තනායක මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි (කැබලි අංක 246) මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 244 සහ 182, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 182, |
| *දකුණට* | : | කැබලි අංක 247 සහ 243, |
| *බටහිරට* | : | කැබලි අංක 243 සහ 244. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහ (30) යි (2024.05.28 සිට 2054.05.27 දක්වා)

(ආ) *වාර්ෂික බදු මුදල*.- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2024 වර්ෂයේ වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ (රු. 5,000,000) ට වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2024.05.28 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*(එ)* බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මේ අනුව ඉහත දක්වා ඇති මගේ නිර්දේශය ප්‍රකාර මෙම දීර්ඝකාලීන බද්ද ලබාදීම පිණිස ගරු ඇමතිතුමාගේ අනුමැතිය මෙහි දැක්වෙන ප්‍රකාර ලබාගෙන දන්වන්නේ නම් මැනවි.

I. ර. ඉ. රෙ. 21 *(1)* යටතේ ගරු ඇමතිතුමාගේ අනුමැතිය.
II. ර. ඉ. රෙ. 21 (2) යටතේ නිවේදන පළ කිරීමට අනුමැතිය.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 ජූලි මස 21 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-189

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.